# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1998 අංක 33 දරන
## සාක්ෂි (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1998 ජූනි මස 12 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 ජූනි මස 12 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 5.75 යි.**

**තැපැල් ගාස්තුව : රු. 2.50 යි.**

## 1998 අංක 33 දරන සාක්ෂි (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1998 ජුනි මස 12 වැනි දින]

එල්.ඩී.—ඕ. 41/96.

**සාක්ෂි ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 33 දරන සාක්ෂි (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සාක්ෂි ආඥාපනතේ 35 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ආඥාපනතේ 35අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :- 14 වන අධිකාරයට 35අ වගන්තිය ඇතුළත් කිරීම.

"ප්‍රකාශයේ අඩංගු කාරණා ගැන පෞද්ගලික දැනීමක් ඇති තෘතීය පාර්ශ්ව විසින් සපයන ලද තොරතුරු මත සකස් කරන ලද වාර්තාවල අඩංගු ප්‍රකාශ අදාළ වන්නේ කවර අවස්ථාවක ද යන වග.

35අ. (අ) යම් තැනැත්තකු විසින් ඒ තැනැත්තා යම් කර්මාන්තයක, වෙළෙඳ ව්‍යාපාරයක හෝ වෘත්තියක යෙදී සිටින හෝ සේවයෙහි නියුක්තව සිටින අතරතුර දී හෝ ඒ තැනැත්තා විසින් දරනු ලබන වැටුප් සහිත හෝ වැටුප් රහිත තනතුරක කාර්ය සඳහා හෝ සකස් කරන ලද වාර්තාවක ; සහ

(ආ) එවැනි යම් තැනැත්තකුට ඒ තොරතුරෙහි කියැවෙන කාරණා පිළිබඳව පෞද්ගලික දැනුමක් තිබූ හෝ තිබුණා යයි සිතිය හැකි වෙනත් යම් තැනැත්තකු විසින් සපයන ලද තොරතුරුවලින් සකස් කරන ලද වාර්තාවක

අඩංගු සිද්ධි පිළිබඳ ප්‍රකාශයක් අදාළ සිද්ධියක් වන්නේ ය.

එසේ වුවද, ඒ ප්‍රකාශය අඩංගු වාර්තාව සකස් කරන ලද්දේ කවර තැනැත්තකු විසින් මුලින් සපයන ලද තොරතුරු අනුව ද, ඒ තැනැත්තාගේ වාචික සාක්ෂි අනුසන්ධානය කිරීම ඒ ප්‍රකාශයෙන් නොකළ හැකි වන්නේ ය.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ පිළිවෙලින් 41අ, 41ආ සහ 41ඇ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 41අ, 41ආ සහ 41ඇ වගන්ති ඇතුළත් කිරීම.

2—D047377—12,900 (98/03)

"සිවිල් නඩු කටයුතුවල දී වරදකරු කිරීම් සටහන් කර ඇති නඩු තීන්දු ආදියේ අදාළ බව.

41අ. (1) අපහාසය සම්බන්ධයෙන් වූ යම් නඩුවක දී යම් තැනැත්තකු සාපරාධී වරදක් සිදු කළේ ද යන ප්‍රශ්නය විවාදාභිමුඛ සිද්ධියක් වන අවස්ථාවක, එම සාපරාධී වරද සම්බන්ධයෙන් ඒ තැනැත්තා වරදකරු කිරීමක් සටහන් කරමින් ශ්‍රී ලංකාවේ යම් අධිකරණයකින් දෙන ලද නඩු තීන්දුවක් වන්නා වූ ද, අභියාචනය කළ හැකි කාල සීමාව ඇතුළත ඊට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු නොලැබූවා වූ ද නැතහොත් අභියාචනයක් මත අවසාන වශයෙන් ස්ථිර කරනු ලැබ ඇත්තා වූ ද නඩු තීන්දුවක්, ඒ තැනැත්තා ඒ වරද කළ බව ඔප්පු කිරීමේ කාර්යය සඳහා අදාළ විය යුතු අතර, එය ඒ සිද්ධිය පිළිබඳ තීරණාත්මක සාධක වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අගතියකින් තොරව, යම්කිසි සිවිල් නඩු කටයුත්තක දී යම් තැනැත්තකු එම සිවිල් නඩු කටයුත්තට පාර්ශ්වකරුවකු වුව ද නොවුව ද, ශ්‍රී ලංකාවේ යම් අධිකරණයක් හෝ යුද්ධාධිකරණයක් හෝ විසින් යම් වරදකට වරදකරු කරනු ලැබ ඇත් ද නැතහොත් වරදක් සංයුක්ත කරන ක්‍රියා කර ඇත් ද යන ප්‍රශ්නය විවාදාභිමුඛ සිද්ධියක් වන අවස්ථාවක, එම වරද සඳහා ඒ තැනැත්තා වරදකරු කිරීමක් වාර්තා කරන ඒ අධිකරණයේ හෝ යුද්ධාධිකරණයේ හෝ නඩු තීන්දුවක් හෝ ආඥාවක් වන්නා වූ ද ඊට විරුද්ධව අභියාචනය කළ හැකි කාලසීමාව ඇතුළත අභියාචනයක් ඉදිරිපත් කරනු නොලැබූවා වූ ද, නැතහොත් අභියාචනයක් අවසාන වශයෙන් ස්ථිර කර ඇත්තා වූ ද, නඩු තීන්දුවක් හෝ ආඥාවක්, ඒ තැනැත්තා ඒ වරද කළ බව හෝ ඒ වරද සංයුක්ත කරන ක්‍රියා කළ බව ඔප්පු කිරීමේ කාර්යය සඳහා අදාළ වන්නේ ය.

(3) මේ වගන්තියේ—

"යුද්ධාධිකරණය" යන්නෙන් යුද හමුදා පනත හෝ නාවික හමුදා පනත හෝ ගුවන් හමුදා පනත හෝ යටතේ සංස්ථාපනය කරන ලද යුද්ධාධිකරණයක් අදහස් වන අතර, "වරදකරු කිරීම" යන්න යුද්ධාධිකරණයක් සම්බන්ධයෙන්

යෙදී ඇති විට, යුද්ධාධිකරණය විසින් කරනු ලැබුවා වූ ද, එකී යුද්ධාධිකරණය සංස්ථාපනය කර ඇත්තේ යම් නීතියක් යටතේ ද ඒ නීතියේ විධිවිධානවලට අනුකූලව ස්ථිර කරනු ලැබ ඇත්තා වූ ද, වරදකරු කිරීමක් අදහස් වේ.

සිවිල් නඩු කටයුතුවල දී අනාචාරයේ හැසිරීම පිළිබඳ තීරණ සටහන් කර ඇති නඩු තීන්දු ආදියේ අදාළ බව.

41ආ. (1) යම් සිවිල් නඩු කටයුත්තක දී යම් තැනැත්තකු ඒ සිවිල් නඩු කටයුත්තේ පාර්ශ්වකරුවකු වුව ද නොවුව ද, අනාචාරය පිළිබඳ වරදකරුවකු වී සිටී ද යන්න විවාදාභිමුඛ සිද්ධියක් වන අවස්ථාවක, ඒ තැනැත්තා අනාචාරය පිළිබඳ වරදට වරදකරු බවට වූ තීරණයක් යම් වෛවාහක නඩු කටයුත්තක දී වාර්තා කර ඇති යම් නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් වන්නා වූ ද, අභියාචනය කළ හැකි කාලසීමාව ඇතුළත ඊට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් නොකර ඇත්තා වූ හෝ අභියාචනයක දී අවසන් වශයෙන් ස්ථිර කරනු ලැබුවා වූ ද නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් ඒ තැනැත්තා එම අනාචාරය සිදු කළ බව ඔප්පු කිරීමේ කාර්යය සඳහා අදාළ වන්නේ ය.

(2) මේ වගන්තියේ "වෛවාහක නඩු කටයුතු" යන්නෙන් විවාහ බන්ධනයෙන් වෙන්වීමේ දික්කසාදයක් සඳහා හෝ වාසයෙන් හා සංවාසයෙන් වෙන්වීමක් සඳහා හෝ වූ නඩුවක් හෝ උඩරට විවාහ හා දික්කසාද පනතේ 33 වන වගන්තිය යටතේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයකු වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් අනුව ඒ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේ පැවති නඩු කටයුත්තක් හෝ මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත යටතේ දික්කසාදය සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් මත කාතිවරයකු හෝ විශේෂ කාතිවරයකු හෝ ඉදිරියේ වූ නඩු කටයුත්තක් අදහස් වේ.

*පැහැදිලි කිරීම්*

(අ) "ඒ" යටතේ "බී" "ඒ"ගේ සේවා නියුක්තියේ නිරතව සිටිය දී 'ඒ' ගේ මෝටර් රථය "බී" විසින් පදවනු ලැබූ අතරතුර "බී" 'සී' ට තුවාල සිදු කරයි. අපරීක්ෂාකාරී ලෙස රිය පැදවීම වෙනුවෙන් 'බී' වරදකරු කරනු ලබයි.

'සී' විසින් "ඒ" ට සහ "බී" ට විරුද්ධව අලාභ සඳහා පවරන ලද නඩුවක දී "බී" ගේ වරදකරු කිරීම අදාළ වේ.

(ආ) "සී" සමග "බී" අනාචාරයේ හැසිරීම මත "බී" ට විරුද්ධව දික්කසාද තීන්දු ප්‍රකාශයක් "ඒ" ලබා ගනී.

"බී" සමග 'සී' අනාචාරයේ හැසිරීමේ හේතුව මත දික්කසාදයක් සඳහා 'සී' ගේ භාර්යාව, 'සී' ට විරුද්ධව නඩු පවරයි. 'සී' සමග 'බී' අනාචාරයේ හැසිරීම ඔප්පු කිරීම සඳහා දික්කසාද තීන්දු ප්‍රකාශය අදාළ වන්නේ ය.

සිවිල් නඩු කටයුතුවල දී පිතෘත්වය පිළිබඳ තීරණ වාර්තා කර ඇති නඩු තීන්දු ආදියේ අදාළ බව.

41ඇ. (1) යම් සිවිල් නඩු කටයුත්තක දී යම් තැනැත්තකු ඒ සිවිල් නඩු කටයුත්තේ පාර්ශ්වකරුවකු වුව ද නොවුව ද, ඔහු දරුවකුගේ පියකු ද යන ප්‍රශ්නය විවාදාභිමුඛ සිද්ධියක් වන අවස්ථාවක, ඒ තැනැත්තා ඒ දරුවාගේ පියා බවට වූ තීරණයක් වාර්තා කරමින් යම් නඩත්තු නඩු කටයුත්තක දී වාර්තා කරන ලද්දා වූ ද අභියාචනා කළ හැකි කාලසීමාව ඇතුළත ඊට විරුද්ධව අභියාචනා කර නොමැත්තා වූ හෝ අභියාචනයේ දී අවසාන වශයෙන් ස්ථිර කර ඇත්තා වූ ද ආඥාවක් ඒ තැනැත්තා ඒ දරුවාගේ පියා බව ඔප්පු කිරීමේ කාර්යය සඳහා අදාළ වන්නේ ය.

(2) මේ වගන්තියේ "නඩත්තු නඩු කටයුතු" යන්නෙන් නඩත්තු ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ ආඥාවක් සඳහා මහෙස්ත්‍රාත්වරයකු වෙත කරන ලද ඉල්ලීමක් අනුව ඒ මහෙස්ත්‍රාත්වරයා ඉදිරියේ පවත්වන ලද නඩු කටයුතු හෝ මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ දරුවකු විසින් හෝ වෙනුවෙන් කාතිවරයකු ඉදිරියේ කරන ලද ඉල්ලීමක් පිළිබඳව පවත්වන ලද නඩු කටයුතු අදහස් වේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ "42 වන වගන්තියේ හෝ එහි පැති සටහනේ 41 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් යෙදෙන කවර හෝ තැනක ඒ වචන හා ඉලක්කම් වෙනුවට "41, 41(අ), 41(ආ) සහ 41 (ඇ) වගන්ති" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියේ හෝ එහි පැති සටහනේ "40, 41 සහ 42 වන වගන්ති" යන වචන සහ ඉලක්කම් යෙදෙන කවර හෝ තැනක ඒ වෙනුවට "40, 41, 41(අ), 41(ආ), 41(ඇ) සහ 42 වන වගන්ති" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියේ "40, 41 හෝ 42 වන වගන්ති" යන වචන සහ ඉලක්කම් වෙනුවට "40, 41, 41(අ), 41(ආ), 41(ඇ) හෝ 42 වන වගන්ති" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.